**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍යප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්,වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත් වී ඇති බව හා හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශනපිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාල ප්‍රමිති වලට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 48 ඡේදය ප්‍රකාරව ප්‍රමිති මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් හිලව් නොකළ යුතු වුවත් පෙර වර්ෂවලදී පැල්වෙහෙර සංචාරක නිකේතනය අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම වෙනුවෙන් දඹුල්ල ප්‍රාදේශීය ලේකම්ගෙන් ප්‍රතිපූර්ණය කරගත යුතු රු. 1,962,545 ක් එම සංචාරක නිකේතනය වෙනුවෙන් 2011 දෙසැම්බර් 12 දින සිට 2019 දෙසැම්බර් 12 දින දක්වා ගෙවිය යුතු රු. 1,000,000 ක බදු කුලියට හිලව් කර ගිණුම්ගත කර තිබුණි. මෙම මුදල ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම මුදල් ප්‍රතිපූර්ණය කරගැනීම සඳහා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් වෙත ලිඛිත ඉල්ලීම් කර ඇත. නමුත් 2020 අගෝස්තු 11 දිනැති අංක 5/3/9/3/28 දරන ලිපිය මගින් ඔවුන් එකඟතාව ලබාදී නොමැත. නැවත වැඩිදුර කරුණු දක්වමින් 2021 අප්‍රේල් 19දිනැති AD/2/5/0/08 දරන ලිපිය ප්‍රාදේශීය ලේකම් දඹුල්ල වෙත යොමුකර ඇත. තවදුරටත් මෙම මුදල අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණප්‍රමිති ප්‍රකාරවඅවසර දී ඇති විටෙකහැර ආදායම් හා වියදම් හිලව් නොකළ යුතු අතර අලුත්වැඩියා වියදම් ප්‍රතිපූර්ණය කරගත යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 ඔක්තෝබර් 08 දින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා අග්‍රාමාත්‍ය කාර්යාලයේ ආරක්ෂක නිලධාරීන්ට කාමර පහසුකම් ලබාදීම වෙනුවෙන් අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් රු. 1,363,000 ක් අයවිය යුතු බව ලේඛකාධිකාරී විසින් 2021 පෙබරවාරි 11 දින අග්‍රාමාත්‍ය අතිරේක ලේකම් අමතන ලද අංක 10/01/82(v) දරන ලිපියේ සඳහන් වුවද එම මුදල සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. මේ හේතුවෙන් නේවාසිකාගාර ආදායම සහ ලැබිය යුතු ආදායම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිලධාරීන්ට කාමර ලබාදීමට අදාළ බිල්පත් පිළියෙල කිරීම 2021 වර්ෂය තුළ සිදුවීම මත 2020වර්ෂයේ ගිණුම් ගත කිරීමට නොහැකි විය. මෙම ආදායමට අදාළ ගැලපීම් 2021 වර්ෂය තුළ සිදුකර ඇත. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට රු. 25,508,310 ක් වූ මුළු ණයගැති ශේෂයෙන් විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැතියෝ හැර අනෙකුත් ණයගැති ශේෂයෙන් රු. 610,215 ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට අය නොවී පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. මෙම ණය ශේෂය තුළ රු. 482,304 ක මුදලක් සේවකයින්ගෙන් අයවිය යුතුව ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. | විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැතියන් හැර අනෙකුත් ණයගැතියන්ගේ වර්ෂ 5ට වැඩි ශේෂය සැකසී ඇති ආකාරය පිළිබඳව විස්තරාත්මකව දක්වා ඇත. | අයවිය යුතු ශේෂ කාලීනව අයකර ගත යුතුය. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට ආයතනයේ 2002 වර්ෂයට පෙර සිට පැවත එන විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැතියන්ගෙන් රු. 12,874,881 ක මුදලක් අයවිය යුතුව පවතින අතර ඒවා අයකර ගැනීමට අපොහොසත්ව තිබුණි. | 2020 දෙසැම්බර් 31 දිනට ආයතනයේ විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැතියන්ගෙන් රු. 12,874,129 ක මුදලක් පමණක් අයවිය යුතුව තිබුණි. ආයතනය විසින් පසුගිය වසර දහය තුළ විදේශ ශිෂ්‍යත්වලාභී ණය ගැතියන් පිළිබඳ විශේෂ අවධානයක් යොමු කොට ඒ සම්බන්ධව උපායශීලීව කටයුතු කිරීම නිසා මෙම තත්‍ය ණය ශේෂය අඩු වී ඇත. | පරීක්ෂණ සිදුකර සුදුසු පියවර ගැනීම හා මුදල් අයකර ගැනීම. |
| (ඇ) | 2006 ජනවාරි 03 දින නීතිපති වෙත නඩු පැවරීමට දන්වා තිබුණද එතෙර ලිපිනය නොමැති වීම නිසා විදේශ ශිෂ්‍යත්ව ණයගැතියෙකු වන පර්යේෂණ නිලධාරී එම්.එස්. ගෞරී ශංකර් යන අයට විරුද්ධව | ඔහුගේ වර්තමාන ලිපිනය සොයාගැනීමට නොහැකි වීම හේතුවෙන් දැනුම් දීමේ ලිපිය (Letter of Demand) යැවීමට නොහැකිවී ඇත. නමුත් ආයතනය විසින් එම ලිපිනය | ලිපිනය සොයාගෙන නීතිමය පියවර ගත යුතුය. |

| | |
|---|---|
| නීතිමය පියවර ගැනීමට නොහැකි වීම හේතුවෙන් ඔහුගෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 3,634,110 ක මුදලින් කිසිඳු මුදලක් 2020 වර්ෂය තුළදීද අයකර ගැනීමට නොහැකි වී තිබුණු අතර එම ලිපිනය සොයාගැනීම පිළිබඳව ආයතනයේ ප්‍රමාණවත් අවධානය යොමු වී නොතිබුණි. | සොයාගැනීමට විවිධ ක්‍රියාමාර්ග වෙත යොමු වුවද එය ප්‍රමාණවත් නොමැත. |

## 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු. 17,207,081 ක ණයහිමි ශේෂය තුළ රු. 626,737 ක වර්ෂ 05 කට වැඩි කාලයක සිට නිරවුල් නොකළ ශේෂයක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. | ආයතනයේ වර්ෂ 5 කට වැඩි රු626,737. ක ණයහිමි ශේෂය පිළිබඳව විස්තරාත්මකව දක්වා ඇත. | ගෙවිය යුතු ශේෂසඳහා හිමිකම් පාන අය නොමැති නම් සුදුසු ගැලපීම් සිදුකළ යුතුය. |

## 1.7 නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ. 756 | 2020 වර්ෂයේ පුස්තකාල පොත් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2020 වර්ෂයේ පුස්තකාල පොත් සමීක්ෂණයේ කෙටුම්පත් වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොමැත. | පුස්තකාල පොත් සමීක්ෂණය කර විගණනය වෙත වාර්තාවේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.16,201,196 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 2,065,352 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.14,135,844 ක පිරිහිමක් නිරීක්ෂණය විය. මෙම පිරිහිමට ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රජයේ ප්‍රදාන රු. 20,260,250 කින් අඩුවීම, පර්යේෂණ හා පුහුණු කටයුතු සඳහා ලද ප්‍රාග්ධන ප්‍රදාන රු. 15,194,579 කින් අඩුවීම, වෙනත් ආදායමරු. 12,219,495 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වි තිබුණි.

**2.2** **ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

ඉකුත් වර්ෂය සමඟ සමාලෝචිත වර්ෂය සැසඳීමේදී වෙනත් ආදායම්, රජයේ ප්‍රදාන, ප්‍රාග්ධන ප්‍රදාන, වෙනත් පාර්ශවයන්ගෙන් ලද අරමුදල් පිළිවෙළින් සියයට 38, 12, 97 හා 43 කින් අඩු වී තිබුණි. එසේම සේවක සේවක, පරිශ්‍රමික, පර්යේෂණ හා පුහුණු වියදම් හා වෙනත් වියදම් පිළිවෙළින් සියයට 5, 90, 43 හා 41 කින් අඩු වී තිබුණි.

**2.3** **අනුපාත විශ්ලේෂණය**

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම් අතිරික්ත අනුපාතය සියයට 8.08 කින් වැඩි වී ඇති අතර ජංගම අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය පිළිවෙළින් සියයට 0.23 කින් හා සියයට 0.28 කින් අඩුවී තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2012-2015 කාලපරිච්ඡේදය තුළ රු. 1,031,020 ක පිරිවැයක් දරා ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත කර තිබූ ජීව වායු ඒකකය 2016 වර්ෂයේ සිට ක්‍රියා විරහිතව පැවති අතර, ඒ වෙනුවෙන් 2018 වර්ෂයේදී රු. 22,500 ක් අත්තිකාරම් වශයෙන් ගෙවා බැලූනයක් මිලදී ගෙන තිබුණද ඒකකයේ අනෙකුත් ක්‍රියාකාරීත්වයන්ගේ දෝෂ පැවතීම තුළ එම බැලූනය ස්ථාපිත කර නොතිබුණු අතර 2020 දෙසැම්බර් 31 දින වන විට ඒකකයේ මුළු වියදම රු. 1,053,520 ක් වී තිබුණි. එය දීර්ඝ කාලයක් අලුත්වැඩියා නොකර තිබීම හේතුවෙන් එහි උපාංග අක්‍රීය වී නැවත භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්වී තිබුණි. | මෙම අත්තිකාරම් මුදල පියවීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. තවද මෙම ජීවවායු ඒකකය සම්බන්ධයෙන් මු.රෙ. 104 ප්‍රකාරව කටයුතු කිරීමට අධ්‍යක්ෂතුමා කමිටුවක් පත්කර ඇති අතර එම කමිටුවේ නිර්දේශය මත ඉදිරි කටයුතු කරමි. | සුදුසු පරිදි උපයෝජනයට හෝ අපහරණයට පියවර ගත යුතුය. |
| (ආ) | 2015, 2016, 2018 හා 2019 වර්ෂවල රු. 4,453,000 ක් වැයකර ආයතනය විසින් ආරම්භ කර තිබුණු පර්යේෂණ ව්‍යාපෘති 07 ක් වර්ෂ 01 ක සිට වර්ෂ 05 දක්වා කාලයක් ගත වී තිබුණත් 2020 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. එම තත්ත්වය හේතුවෙන් කාලීන අවශ්‍යතා මත සිදුකරන පර්යේෂණ වැඩසටහන් තුළින් නියමිත කාලසීමාව තුළ අදාළ නිර්දේශ අවශ්‍ය පාර්ශව වෙත ලැබී නොතිබුණි. | වර්තමාන ප්‍රගතිය විස්තරාත්මකව දක්වා ඇත. | ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කර පර්යේෂණ ව්‍යාපෘති කාලීනව අවසන් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කෘෂිකර්ම අමාත්‍යවරයාගේ ආරක්ෂක නිලධාරීන් සඳහා නේවාසිකාගාරයේ කාමර කුලියට දීම වෙනුවෙන් 2015 සැප්තැම්බර් සිට 2018 ජූලි මස දක්වා කාලයට අයවිය යුතු රු. 8,895,470 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අධ්‍යක්ෂ විසින් 2019 ජූලි 10 දිනැතිව අංක R/Info/5 ලිපිය මගින් මෙය පිලිබඳ තොරතුරු අනාවරණය කරගැනීමට ආයතනයේ නිලධාරීන් තිදෙනෙකුගෙන් යුතු කමිටුවක් පත්කර ඇති අතර එම කමිටු වාර්තාව 2019 සැප්තැම්බර් 02 දින අධ්‍යක්ෂවරයාට ලබාදී ඇත.එම කමිටු වාර්තාව මගින් අයකර ගතයුතු වටිනාකම ලෙස හඳුනාගත්රු. 8,895,470 ක වටිනාකම අයකර ගැනීමේ ක්‍රමවේදය පිලිබඳව සලකා බැලීමට2021 පෙබරවාරි 24 දිනැති අංක R/Info/5-II ලිපිය මගින් නව කමිටුවක් පත්කර ඇත. 2021 අප්‍රේල් 19 දිනැතිව එම කමිටුවේ වාර්තාවද අධ්‍යක්ෂ වෙත යොමුකර ඇත. ඒ අනුව ඉදිරියේදී අදාළ මුදල අයකර ගැනීමට කටයුතු කරමි. | කුලී ගාස්තු අය කරගත යුතුය. |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට අවසන් කර ප්‍රකාශනයට පත් කළ යුතු එහෙත් අවසන් නොකළ පර්යේෂණ ව්‍යාපෘති 10 ක් අවසන් කර ඇති බව කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ දක්වා තිබුණි. | පර්යේෂණ ව්‍යාපෘතියක් දත්ත විශ්ලේෂණය කොට වාර්තාව පිළියෙල කිරීමේදී පර්යේෂණ නිලධාරියා හට එම ව්‍යාපෘතිය පිළිබඳ සොයාගැනීම් හා නිර්දේශ ඉදිරිපත් කළ හැක. එනම් එම සොයාගැනීම් හා නිර්දේශ විවිධ අවස්ථාවලදී අවශ්‍ය තීරණ ගැනීම සඳහා ඉදිරිපත් කිරීම සිදු කෙරේ.<br>නමුදු පර්යේෂණ ක්‍රියාවලියේදී සියයට 60 සිට සියයට 100 අතර භෞතික ප්‍රගතියක් පෙන්නුම් කරන විට එයට අදාළ වනුයේ වාර්තාව පිළියෙල කොට එය ප්‍රසිද්ධියට පත් කිරීමයි .<br>මේ අනුව වාර්ෂික වාර්තාවේ කාර්යසාධනය ඉදිරිපත් කිරීමේදී පර්යේෂණ ව්‍යාපෘති “සිදුකරමින් පවතින” හා අවසන් කළ අධ්‍යයනය වශයෙන් කාණ්ඩ 02 කින් ඉදිරිපත් කෙරේ. මෙහිදී අවසන් කළ අධ්‍යයනය අනුව පර්යේෂකයාට තම පර්යේෂණය සොයා ගැනීම් හා නිර්දේශ ඉදිරිපත් කිරීමේ මට්ටමක පවතින අධ්‍යයනයක් වේ. ඒ අනුව 2020 වාර්ෂික වාර්තාවේ මෙම සියලු අධ්‍යයනයන් පර්යේෂණ වාර්තා ප්‍රසිද්ධියට (Published) පත් කර නොතිබුණද එම අධ්‍යයනයන්හි සොයාගැනීම් හා නිර්දේශ ඉදිරිපත් කිරීමේ මට්ටමක පවතී .<br>එම නිසා උක්ත සියලු අධ්‍යයන 2020 පාලන වාර්තාව පිළියෙල කරන අවස්ථාව වන විට එනම් 2021 මාර්තු මාසයේදී අවසන් කළ පර්යේෂණ ව්‍යාපෘති වශයෙන් සටහන් වේ. එලෙසම මෙම වාර්තා පර්යේෂණ ක්‍රියාවලියේ අවසන් අවදිය වේ. එනම් (60% - 100%) අතර ප්‍රගතියක් පෙන්නුම් කෙරේ. | 2020 වර්ෂයේ නිම කළ පර්යේෂණ ව්‍යාපෘති පිළිබඳව පමණක් එම වර්ෂයේ කාර්යසාධන වාර්තාවට ඇතුළත් කළ යුතුය. |

**3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේදී රු. 89,000 ක් වැය කර මිලදී ගෙන තිබුණු කැමරාවක්2020 ජූලි 14 දින විගණනය විසින් සිදු කරන ලද පරීක්ෂාවේදී ආයතනය තුළ නොතිබුණු බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නැත. | මු.රෙ. 104 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේදී ආයතනයේ නව ශාලාවේ වහලය අලුත්වැඩියා කිරීම සඳහා මිලදී ගත් රු. 123,220 ක් වටිනා ඇස්බැස්ටෝස් ෂීට් 82 ක් අදාළ කාර්යය සිදු නොකර අනාරක්ෂිතව ආයතනය තුළ ගබඩා කර තිබුණු අතර ඒවායින් බොහෝමයක් සමාලෝචිත වර්ෂය වන විට කැඩී බිඳී ගොස් තිබුණි. | පසුගිය වර්ෂය තුළ අවස්ථා කිහිපයකදී මෙම නව ශාලාවේ අලුත්වැඩියාව සඳහා මිල ගණන් කැඳවූ නමුත් කිසිදු ටෙන්ඩර්කරුවෙකු අලුත්වැඩියා කටයුතු සඳහා ඉදිරිපත්වී නොමැති බැවින් අලුත්වැඩියා කිරීම ප්‍රමාද වී ඇත. මෙම අලුත්වැඩියාව සඳහා අවශ්‍ය කටයුත ප්‍රසම්පාදනය කර මෙම ෂීට් ඒ සඳහා යොදා ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. | මිලදී ගත් භාණ්ඩ උපයෝජනය කළ යුතුය. |

**3.4 වාහන පද්ධතිය කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් ආයතනය වෙත ලබා දී ඇති අංක 40 – 3933 දරන වාහනය නීත්‍යානුකූලව හිමිකාරීත්වය ආයතනය වෙත පවරාගෙන නොමැති අතර 2015 වර්ෂයේ සිට අභාවිතව පැවතුණි. | මෙම වාහනය එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් මෙම ආයතයේ පර්යේෂණ කටයුතු සඳහා ලබාදී ඇති අතර එහි අයිතිය අප ආයතනය වෙත පවරාදී නොමැත. එසේ අයිතිය පවරා ගන්නේ නම් පසුගිය වර්ෂවල සිට වාහන බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් රජයට ගෙවිය යුතු ගාස්තු ගෙවිය යුතු අතර වාහනයේ වර්තමාන තත්ත්වය හා වටිනාකම අනුව ආයතනයට එය අවාසිදායක වේ. මෙම වාහනය ආපසු ලබාගන්නා ලෙස එම ආයතනයට දන්වා යවා ඇත. මේ දක්වා එම ආයතනයෙන් ප්‍රතිචාර ලැබී නොමැත. | වාහනයේ අයිතිය පවරාගෙන අලුත්වැඩියා කළ යුතුය. |

**4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය.**

**4.1 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය වෙත 2021 මාර්තු 04 දින යොමුකර ඇත. 2020වර්ෂය තුළ පැවති Covid 19 වසංගත තත්ත්වය මත වාර්ෂික | නොපමාව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| | | වාර්තා පිළියෙල කිරීම හා පාලක ආයතනයේ අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද විය. පාලක ආයතනයේ අනුමැතිය ලැබූ වහාම 2019වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය කටයුතු කරමි. | |

**4.2** **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම.**

**-------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් 2019 වර්ෂයේ ආරම්භ කර 2020 වර්ෂයේ අවසන් කළ යුතු පර්යේෂණ ව්‍යාපෘති 11 ක් සඳහා රු. 8,366,000 ක් වැයකර තිබුණද 2020 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රසිද්ධියට පත් නොතිබුණි. | ව්‍යාපෘති පිළිබඳව වෙන වෙනම දක්වා ඇත. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කාර්යයන් නිසි පරිදි කළ යුතුය. |
| (ආ) | ප්‍රතිපත්ති සම්පාදකයින්ට කෘෂිකාර්මික අංශයට අදාළව වර්තමාන ප්‍රතිපත්ති හා නව ප්‍රතිපත්තිවල සිදු කළ යුතු අවශ්‍ය වෙනස්කම් හා ඒ සම්බන්ධ තොරතුරු ලබා දීමේ අරමුණු ඇතිව 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මගින් ආයතනික ප්‍රකාශන (Institute Publications) සඳහාරු. මිලියන 0.90 ක් වෙන්කර තිබුණද එම ප්‍රතිපාදන යොදාගෙන කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණි. | මෙම තත්ත්වය නිවැරදි කිරීම සිදු කරමින් පවතී | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කාර්යයන් නිසි පරිදි කළ යුතුය |
| (ඇ) | ආයතනයේ ප්‍රමුඛතම කාර්යයක් වන පර්යේෂණ වැඩසටහන් සිදු කිරීමෙන් ජනනය වන පර්යේෂණ සොයා ගැනීම් හා නව දැනුම අවශ්‍ය පාර්ශවයන් වෙත ලබාදීම සඳහා හඳුනාගත් වැඩසටහන් වාර්ෂිකව හෝ යම් කාල සීමාවකට වරක් විධිමත්ව ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය වූ අතර 2017, 2018, 2019 සහ 2020 වර්ෂවලදී පර්යේෂණ වාර්තා එළි දැක්වීමේ කාර්යය සඳහා ක්‍රියාකාරී සැලසුම් මගින් ප්‍රතිපාදන වෙන්කිරීමද සිදුකර නොතිබුණි. | ආයතනය මගින් වාර්ෂිකව සිදුකරන පර්යේෂණ එළි දැක්වීම් (ResearchColloquium) 2015 වර්ෂයේදී අවසාන වශයෙන් සිදු කරන ලදි. නමුදු විවිධ පාර්ශවයන් සඳහා ආරාධනා කළද පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය සියයට 20 කඅඩු ප්‍රමාණයක පැවතීම නිසා පර්යේෂණ සොයා ගැනීම් හා නව දැනුම අවශ්‍ය පාර්ශවයන් වෙත ලබා දීම සඳහා විවිධ වැඩසටහන් 2016 වර්ෂයෙන් පසුව සිදු කරන ලදී. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කාර්යයන් නිසි පරිදි කළ යුතුය |